
# කොණ්ඩ කැවුම



තිසුමි නිමෙත්මා වීරසේකර

# කොණ්ඩ කැවුම

තිසුමි නිමෙත්මා වීරසේකර

ග්‍රන්ථ නාමය - කොණ්ඩ කැවුම

කතෘ නාමය - තිසුම් නිමෙත්මා වීරසේකර

කතෘගේ වෙනත් කෘති - දඟකාර තාර පැටියා

සිගිතිගේ ගෙවත්ත

ISNB - 978-624-208-076-5

ප්‍රකාශිත වර්ෂය - 2023

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබු සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි


ශෂිකලා සේනාධීර
විදුහල් පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 10 20

මලිතිගේ අත්තම්මා කොණ්ඩ කැවුම් හදන්න හරිම දක්ෂයි.

මලිති ඒ කොණ්ඩ කැවුම් කන්න හරිම ආසයි. එදා මලිතිගේ උපන් දින දවස. මලිතිගේ අත්තම්මා උපන් දිනේට කැවුම් හැදුවා.



ඉතින් අත්තම්මා කැවුම් හදලා ඉවර කළා. අත්තම්මා කැවුම් හදලා ඉවරවෙලා කැවුම් ටික වට්ටියකට දැම්මා. ඒ වට්ටියේ හිටියා දැගකාර කැවුමක්. එයාට හිතුණා අවට වටපිටාවේ සිරි නරඹන්න. එයා වට්ටියෙන් එළියට පනින්න සූදානම් වුණා.



එතකොටම එහි හිටපු තවත් කැවුමක් එයාට " එළියට යන්න එපා. ඔයාට කරදරයක් වෙයි. ඒ නිසා යන්න එපා " කියලා කිවුවා. තව කිහිප දෙනෙක්ම එහෙම කිවුවා. ඒ වුණාට එයා ඒ කිසිම දෙයක් ඇහුවේ නැහැ. එයා එළියට ගියා.



දැගකාර කොණ්ඩ කැවුම එළියට ගියා. "මේ වටපිටාව කොච්චර ලස්සනද බලන්න. අරගොල්ලෝ මට බොරු කියලා, මම එයාලගේ කතා අහලා මේ ගමන ආවේ නැත්තම් මට මේ ලස්සන බලා ගන්න ලැබෙන්නෙත් නෑනේ." කියලා එයාට හිතුණා. එයා දිගටම ඇවිදගෙන ගියා. එයා දැක්කා පාසලක් . එයා දැක්කා ළමයි පිරිසක් මොනවද කනවා.




එයාලා ඒ කන්නේ එයාගේ වර්ගයේ අය කියලා එයා හොඳටම බය වුණා. එයා පස්සෙන් ළමයෙක් දුවගෙන ආවා. කැවුම හිතුවා ඒ එයාවත් කන්න වෙන්නැති කියලා. එයා වේගයෙන් දිවුවා මැද දුරක් ගිහිල්ලා එයා ගසක් පිටිපස්සේ හැංගුණා. ඊට පස්සේ එයා ගමට ළං වුණා. එයා දැක්කා බල්ලෙක් තමාට පිටිපස්සෙන් එන බව. බල්ලා බිරුවා.





බල්ලා එයාගේ පස්සෙන් පන්නන්න ගත්තා. කැවුම බය වුණා. එයා ගම ඇතුළටම දිවුවා. දුවලා ගහකට නැග්ගා. ඊට පස්සේ කැවුම දැක්කා තමාට දකුණු පසින් කපුටෙකු සිටින බව. කපුටාගේ කටට කෙළ ඉණුවා. කපුටා කැවුම හොටින් රැගෙන පියැඹුවා. කැවුම ඇඩුවා. එයා බය වුණා.

එයාට මතක් වුණා යාළුවෝ කියපු දේවල්. එයා හයියෙන් කැගෑසුවා. කපුටා බය වෙලා කැවුම බිමට අතඇරියා. එයා ගඟට වැටුනා. හරිම අමාරුවෙන් එයා ගොඩ ආවා. ගෙදර ගිහිල්ලා යහළුවන්ගෙන් සමාව ගත්තා. එයා වරද පිළිගත්තා.





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දූරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකිමෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයිපාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඍදුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

**මෙයට**
**සෙනෙවිරත්න මහලේකම්**
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ**
**2023 10 20**